# පොදු දේපළ රැකගැනීමේ වැඩසටහන
# பொது வளங்களை பாதுகாப்பதற்கான திட்டம்
# Programme for Protection of Public Resources

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity



No 183/5, High Level Road, Colombo 06 Tel: 011 5627432 Fax: 011 5882225 Email: 2015pppr@gmail.com


2015- 01-04
PPPR/MM/SR 03

## ජනාධිපතිවරණයේදී රාජ්‍ය මාධ්‍ය හැසිරීම පිළිබඳ නිරීක්‍ෂණ වාර්තා අංක 03

රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිතා කිරීමෙන් සිදුවන මහජන මුදල් නාස්තිය අවම කිරිමේ අරමුණින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) ක්‍රියාත්මක කරන පොදු දේපළ රැකගැනිමේ වැඩසටහන යටතේ, රාජ්‍ය මාධ්‍යවල හැසිරීම පිළිබඳව මෙම මාධ්‍ය නිරීක්‍ෂණ මගින් අවධානය යොමු කරනු ලැබේ.

සම්මත වෘත්තීය ප්‍රමිතීන්ට අනුව රාජ්‍ය මාධ්‍ය එහි වගකීම ඉටු කිරීමේදී නිරවද්‍ය, සමබර, අපක්ෂපාතී හා අපාක්ෂික ආකාරයෙන් තොරතුරු ලබා දෙන්නේද? විවාදය සහ සාකච්ඡාව සඳහා සුදුසු මහජන වේදිකාවක් සැපයීම මගින් ඡන්දදායකයාට දැනුම්වත් තීරණයක් ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසන්නේද? යන කරුණු කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ක්‍රමවේදය මගින් මාධ්‍යවල අන්තර්ගතය සහ එහි අර්ථ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරනු ලැබේ. මෙහිදී ජනමාධ්‍යයේ පිළිගත් ප්‍රමිතීන් සහ ආචාර ධර්මානුකූල මාධ්‍ය  භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ.

මැතිවරණ සමයේ රාජ්‍ය මාධ්‍ය හැසිරීම පිළිබඳව නිරීක්ෂණ සිදුකරමින් වරින්වර මෙවැනි වාර්තා ඉදිරිපත් කිරීමටත්, මැතිවරණය අවසානයේ ඒ පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් පොදු දේපළ රැකගැනීමේ වැඩසටහනේ මාධ්‍ය නිරීක්ෂණ කණ්ඩායම අපේක්ෂා කරයි.  මෙම වාර්තාවේ අපගේ නිරීක්‍ෂණ පිළිබඳ ඔබගේ ප්‍රතිචාර හා ජනාධිපතිවරණයේ රාජ්‍ය මාධ්‍ය භාවිතය පිළිබඳව ඔබගේ නිරීක්‍ෂණ අප වෙත යොමු කරමින් මෙම කාර්යය වඩාත් සාර්ථක කරගැනිමට ඔබටත් දායක විය හැකිය.


අපගේ ලිපිනය

pppprmm@gmail.com


මාධ්‍ය නිරීක්ෂණ, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, අංක 183/5, හයිලෙවල් පාර, කොළඹ - 06.


පහත දැක්වෙන්නේ දෙසැම්බර් 20 සිට 26 දක්වා කාලය තුළ ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනී ජාලයේ (ITN) සිංහල හා දෙමළ රාත්‍රී ප්‍රවෘත්ති විකාශයන්හි කාලය ජනාධිපති අපේක්‍ෂකයින් 19 දෙනා සඳහා  බේදී ගොස් ඇති ආකාරය යි  මෙම විශ්ලේෂණයේ දී ප්‍රවෘත්ති විකාශනය සඳහා වෙන් වූ සමස්ත කාලයෙන් මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වූ කාලය වෙන් කර හඳුනා ගනිමින් එය ජනාධිපති අපේක්‍ෂකයන් අතර බේදී ගොස් ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කර තිබේ

මෙම අධ්‍යයනයේ දී **ජනාධිපතිවරණයට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන** ලද **විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය** උපමාන දක්වෙන **අතිවිශේෂ ගැසට් නිවේදනය**[1] හා පිළිගත් ජනමාධ්‍ය ප්‍රමිතීන් මත පිහිටා අපගේ නිරීක්ෂණ සිදු කර තිබේ.

## ජනාධිපතිවරණයේ දී රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය (ජාතික රූපවාහිනී) පිළිබඳ හැසිරීම - රාත්‍රී 8:00 පුවත්

අදාළ සතිය තුළ ජාතික රූපවාහිනියේ රාත්‍රී 8 ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 231 තත්පර 25 කි. එයින් විනාඩි 59 තත්පර 27 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 41 තත්පර 39 ප්‍රමාණයක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. අදාළ සතිය තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 4 තත්පර 17 ක් පමණකි.




- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුම්වත් කිරීම්


(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය තුළ මැතිවරණයට අදාළ පුවත් හා සෙසු පුවත් වෙනුවෙන් කාලය වෙන් වී ඇති අයුරු)

[1] 2014 නොවැම්බර් 14 දින අංක 1890/2, www.documents.gov.lk

# දින හතෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති සමස්ත කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය

## ජාතික රූපවාහිනී - රාත්‍රී 8:00 පුවත් (සිංහල)

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්


**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින හතෙහි ම ප්‍රවෘත්ති විකාශය තුළ පැහැදිලි ඉඩක් වෙන් ව ඇතත් (සතිය තුළ විනාඩි 78 තත් 57 ක්) සෙසු ජනාධිපති ධූර අපේක්ෂකයින් අතරින් නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට (පොදු අපේක්ෂකයාට) හැර (විනාඩි 42 තත්පර 31) වෙනත් කිසිදු අපේක්ෂකයකුට කිසිදු ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම් සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මක භාවිතා වී ඇති බව නිරීක්ෂණය වන අතර නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට වෙන් වී ඇති කාලයෙන් කොටසක් ඔහු සහභාගී වූ රැස්වීම් ආවරණය සඳහා ද ඉතිරි කාලය අපේක්ෂක ප්‍රතිරූපය බිඳ දැමීම සඳහා ද භාවිතා කර ඇති බව නිරීක්ෂණය වේ.

# ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) - රාත්‍රී 7:00 පුවත් (සිංහල)

අදාළ සතිය තුළ ස්වාධීන රූපවාහිනි ජාලයේ රාත්‍රී 7:00 ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 201 තත්පර 58 කි. එයින් විනාඩි 37 තත්පර 22 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 18 තත්පර 51 ප්‍රමාණයක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. අදාළ සතිය තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 4 තත්පර 46 ක් පමණකි.





- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුම්වත් කිරීම්

(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය තුළ මැතිවරණයට අදාළ පුවත් හා සෙසු පුවත් වෙනුවෙන් කාලය වෙන් වී ඇති අයුරු)

<u>**දින හතෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති සමස්ත කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය**</u>

### ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) - රාත්‍රී 7:00 පුවත් (සිංහල)

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්


**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්‍ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින හතෙහි ම ප්‍රවෘත්ති විකාශය තුළ ඉඩක් වෙන් ව ඇතත් (සතිය තුළ විනාඩි 83 තත් 05ක්) සෙසු ජනාධිපති ධූර අපේක්‍ෂකයින් අතරින් නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්‍ෂකයාට (පොදු අපේක්‍ෂකයාට) හැර (විනාඩි 47 තත්පර 52 ) වෙනත් කිසිදු අපේක්‍ෂකයකුට ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්‍ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම් සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මකව භාවිතා වී ඇති බව නිරීක්ෂණය වේ. 'වෙන් කෙරුණු කාලය'බෙදී ගොස් ඇති ආකාරය සැලකූ විට නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්‍ෂකයාට වෙන් වී ඇති කාලය එම පෙරමුණේ කථිකයන්ගේ පරස්පර කතා ඉස්මතු කර දැක්වීමට හා අපේක්ෂක ප්‍රතිරූපය බිඳ හෙළීම සඳහා භාවිතා කර ඇති බව නිරීක්ෂණය වේ.

# ජාතික රූපවාහිනී - රාත්‍රී 7:00 පුවත් (දෙමළ)

අදාළ සතිය තුළ ජාතික රූපවාහිනියේ දෙමළ විකාශය වන **නේත්‍රා නාලිකාවේ** රාත්‍රී 7:00 ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 205 තත්පර 59 කි. එයින් විනාඩි 30 තත්පර 30 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 81 තත්පර 30 ප්‍රමාණයක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. අදාළ සතිය තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 9 තත්පර 07 ක් පමණකි.





- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුවත් කිරීම්

(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය තුළ මැතිවරණයට අදාළ පුවත් හා සෙසු පුවත් වෙනුවෙන් කාලය වෙන් වී ඇති අයුරු)

# දින හතෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය

## ජාතික රූපවාහිනී - රාත්‍රී 7:00 පුවත් (දෙමළ)

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්


**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින හතෙහි ම ප්‍රවෘත්ති විකාශය තුළ ඉඩක් වෙන් ව ඇතත් (සතිය තුළ විනාඩි 97 තත් 12ක්) සෙසු ජනාධිපති ධූර අපේක්ෂකයින් අතරින් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂකයාට (පොදු අපේක්ෂකයාට) හැර (විනාඩි 3 තත්පර 19) වෙනත් කිසිදු අපේක්ෂකයකුට ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මක භාවිතා වී ඇති බව නිරීක්ෂණය වේ. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂකයාට වෙන් වී ඇති කාලය ඔහු ස්ථාන කිහිපයක සිදු කළ කතා සංස්කරණය කරමින් එම අදහස් විකෘති කර දැක්වීම සඳහාත්, ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂකයාගේ ප්‍රතිරූපය බිඳ හෙළීම සඳහාත් භාවිතා වී ඇති බව නිරීක්ෂණය වේ.

# ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) - රාත්‍රී 8:00 පුවත් (දෙමළ)

අදාළ සතිය තුළ ස්වාධීන රූපවාහිනී ජාලයේ දෙමළ විකාශය වන **වසන්තම් නාලිකාවේ** රාත්‍රී 8:00 ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 196 තත්පර 29 කි. එයින් විනාඩි 11 තත්පර 02 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 71 තත්පර 00 ප්‍රමාණයක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. අදාළ සතිය තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 3 තත්පර 01 ක් පමණකි.





- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුම්වත් කිරීම්

(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය තුළ මැතිවරණයට අදාළ පුවත් හා සෙසු පුවත් වෙනුවෙන් කාලය වෙන් වී ඇති අයුරු)

# දින හතෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති සමස්ත කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය

## ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) - රාත්‍රී 8:00 පුවත් (දෙමළ)

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්
**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්
**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්‍ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින හතෙහි ම ප්‍රවෘත්ති විකාශය තුළ ඉඩක් වෙන් ව ඇතත් (සතිය තුළ විනාඩි 81 තත් 18 ක්) සෙසු ජනාධිපති ධූර අපේක්‍ෂකයින් අතරින් නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්‍ෂකයාට (පොදු අපේක්‍ෂකයාට) හැර (විනාඩි 17 තත්පර 57 ) වෙනත් කිසිදු අපේක්‍ෂකයකුට ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්‍ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම් සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මකව භාවිතා වී ඇති බව නිරීක්ෂණය වේ. 'වෙන් කෙරුණු කාලය' බෙදී ගොස් ඇති ආකාරය සැලකූ විට එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්‍ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති කාලයෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්‍ෂකයාට අඩකට මඳක් වැඩි වේලාවක් බෙදී ගොස් ඇතැයි පෙනී ගිය ද එම සමස්ත කාලය ම වෙන් ව ඇත්තේ එම පෙරමුණේ කථිකයන්ගේ පරස්පර කතා ඉස්මතු කිරීමට හා ප්‍රතිරූපය බිඳ හෙළනසුලු ඍණාත්මක දේ සඳහා බව නිරීක්ෂණය වේ.

**<u>පොදු නිරීක්ෂණ</u>**

මෙම සිංහල හා දෙමළ විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති ප්‍රචාරය සඳහා වෙන් වී ඇති කාලය පිළිබඳව නිරීක්ෂණය කිරීමේ දී නාලිකා 4 ම මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා වෙන් කොට ඇත්තේ ඉතා අවම කාලයක් බව (5% කට අඩු) විශේෂයෙන් නිරීක්ෂණය වේ.

අපගේ මුල් වාර්තාවලින් පෙන්වා දුන් ආකාරයට මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති උපමාන හා නිරවද්‍ය, සමබර, අපක්ෂපාතීභාවය ආදී සම්මත මාධ්‍ය ප්‍රමිතීන් රැසක් මෙම භාවිතය තුළ උල්ලංඝනය වෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

විශේෂයෙන් ම තමන් අවට සිදුවන දේ වටහා ගැනීම සඳහා මෙරට ජනගහනයෙන් අතිමහත් පිරිසක් භාවිතා කරන විද්‍යුත් නාලිකා මෙලෙස ඒකපාර්ශ්වික නැමියාවකින් කටයුතු කිරීම මෙම මැතිවරණයේ නිදහස් හා ස්වාධීනභාවයට බාධාවක් බව පෙනී යයි.

මැතිවරණ කොමසාරිස්වරයා සිය උපමාන, මාර්ගෝපදේශ ක්‍රියාවේ යෙදවීමට පරිශ්‍රමයක් දරන බව දක්නට ඇතත් රාජ්‍ය මාධ්‍ය ප්‍රධානීන් එම උපමාන, මාර්ගෝපදේශ පිළිබඳව කිසිදු තැකීමක් නොකරන බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

එස්. රනුග්ගේ

විධායක අධ්‍යක්ෂ

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා